සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

**සැලකිය යුතුයි:**

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **40කි.**

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමග අමුණා භාර දෙන්න.

---

(01) 'පංච මහා විලෝකනය' යන්න නිවැරදිව අර්ථවත් වන්නේ,

(1) සිය වයසට ගැලපෙන දේ සිදු කිරීම වන්න ය.

(2) තමාගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම යන්න ය.

(3) ඉඳුරන් පිනවමින් අතෘප්තිකරව කම්සැප සොයා යාමේ අදහසින් උපත ලැබීම යන්න ය.

(4) නිෂ්කාමී සැහැල්ලු පැවිදි ජීවිතයට ඇතුලු වීමෙන් සංසාරික අභියෝග ජයගත හැකිවීම යන්නයි.

(02) සිදුහත් කුමරු යසෝදරා දේවිය සරණපාවා ගත්තේ කුමරුට

(1) දොළොස් හැවිරිදි වියේ දී ය.
(2) තෙළෙස් හැවිරිදි වියේ දී ය.
(3) පසළොස් හැවිරිදි වියේ දී ය.
(4) සොළොස් හැවිරිදි වියේ දී ය.

(03) ලොව උපන් සත්ත්වයා නිසැකව ම ජරා, ව්‍යාධි, මරණ යන දුක් පීඩාවන්ට ලක්වන බව බෝසත් කුමරු වටහා ගත්තේ,

(1) කිසාගෝතමිය ගැයූ නිබ්බුත පද ඇසීමෙන් අනතුරුව ය.

(2) උපන් විගස 'අග්ගෝහමස්මි..' ආදී ගාථා දෙසීමෙන් අනතුරුව ය.

(3) සතර පෙර නිමිති දැකීමෙන් අනතුරුව ය.

(4) මාලිගාවේ නාටිකාංගනාවන්ගේ රංගන දැකීමෙන් අනතුරුව ය.

(04) 'පස්වග තවුසන් මහණවීමෙන් ඇරඹුණු, එය අද දක්වාම අඛණ්ඩව නොනැසී පවතී. ලොව පවතින පැරණි ම පැවිදි සංවිධානය ද මෙයයි' මේ අදහස්වලින් කියවෙන්නේ,

(1) බුද්ධ රත්නය පිළිබඳවයි.
(2) ධර්ම රත්නය පිළිබඳවයි.
(3) සංඝ රත්නය පිළිබඳවයි.
(4) ත්‍රිවිධ රත්නය පිළිබඳවයි.

(05) බෞද්ධයෙකු වීමේ පළමු පියවර වන්නේ,

(1) නමස්කාර පාඨය තෙවරක් කියවීමයි. (2) පන්සිල් සමාදන් වීමයි.

(3) දිනපතා පන්සිල් සමාදන් වීමයි. (4) තෙරුවන් සරණ යාමයි.

(06) ''ජලය කැළඹී ඇත්නම් එහි කිසිවක් නොපෙනේ. එමෙන් ම සිත කැළඹුණු විට, නොසන්සුන් වූ විට මතකය අවදි නොවේ.' මෙම උපමාවන් මඟින් පැහැදිලි වන්නේ,

(1) ව්‍යාපාද නීවරණය පිළිබඳව ය.

(2) ථීන මිද්ධ නීවරණය පිළිබඳව ය.

(3) උද්දච්ච - කුක්කුච්ච නීවරණය පිළිබඳව ය.

(4) විචිකිච්ඡා නීවරණය පිළිබඳවයි.

(07) 'ගෞතමයන් වහන්ස, ඇතුළත අවුල්ය, පිටත ද අවුල්ය, සත්ත්ව ප්‍රජාව වුලෙන් වෙළී සිටියි. කවරෙක් නම් මේ අවුල නිරාකරණය කරන්නේ ද? දෙවියන් ඇසූ මෙම ප්‍රශ්නයට බුදුන්වහන්සේගේ පිළිතුර වූයේ,

(1) දන් දෙන තැනැත්තා එම අවුල නිරවුල් කරගන්නා බව ය.

(2) සිල් රකින තැනැත්තා එම අවුල නිරවුල් කරගන්නා බව ය.

(3) විදර්ශනා භාවනාව වඩන තැනැත්තා එම අවුල නිරවුල් කරගන්නා බව ය.

(4) සමථ භාවනාව වඩන තැනැත්තා එම අවුල නිරවුල් කරගන්නා බව ය.

(08) වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් විසින් රචිත ග්‍රන්ථයක් වන්නේ,

(1) බුදුගුණ අලංකාරය ග්‍රන්ථයයි. (2) මුනිගුණ අලංකාරය ග්‍රන්ථයයි.

(3) ලෝවැඩ සඟරාව ග්‍රන්ථයයි. (4) ලෝකෝපකාරය ග්‍රන්ථයයි.

(09) සෑම ගමකම ධර්ම දේශකයන් වහන්සේලා ලවා ධර්ම දේශනා කරවීම, තමන් විසින් කරන ලද සියලු යහපත් කටයුතු පින් පොතෙහි සටහන් කිරීම ඇතුලු ක්‍රියාවන් සිදුකළ ශ්‍රේෂ්ඨ රජතුමා වන්නේ,

(1) දේවානම්පියතිස්ස රජතුමා ය. (2) වළගම්බා රජතුමා ය.

(3) දුටුගැමුණු රජතුමා ය. (4) සද්ධාතිස්ස රජතුමා ය.

(10) ''තරුණ වියෙහි දී උතුම් සීලාදී පිළිවෙත්හි නොයෙදී උපන් ධනය රැක ගැනීමට හා නූපන් ධනය ඉපදවීමෙන් තොරව ජීවත්වන්නා දිය සිඳීගිය පොකුණ දෙස බලා පසුතැවෙන මහලු කොස්වාළිහිණියෙකු වැනිය.'' මෙම අදහස ගෙන දෙන ධම්මපද ගාථාව වන්නේ,

(1) ආචාරිබා බ්‍රහ්ම චරියං.... යන ගාථාවයි.

(2) උට්ඨානවතෝ සතිමතෝ... යන ගාථාවයි.

(3) සුභානුපස්සිං විහරන්තං.... යන ගාථාවයි.

(4) ආරෝග්‍ය පරමාලාභා.... යන ගාථාවයි.

(11) සිඟාලෝවාද සූත්‍රයේ දක්නට ලැබෙන ආකාරයට භෝග විනාශයට හේතුවන කරුණක් නොවන්නේ,

(1) නැටුම් ගැයුම් වැයුම් වලට ලොල් වීම (2) පවිටු මිතුරන් ඇසුරු කිරීම

(3) අලසකමින් කල්ගෙවීම (4) අප්‍රමාදීව කටයුතු කිරීම

(12) මරණාසන්න මොහොතේදී සුගතියම දක සිහියෙන් යුතුව කළුරිය කළ උපාසකතුමා
(1) අනාථපිණ්ඩික සිටුතුමා ය. (2) නකුල උපාසකතුමා ය.
(3) ධම්මික උපාසකතුමා ය. (4) සුදත්ත සිටුතුමා ය.

(13) ''පුබ්බාචරිය, පුබ්බදේව'' යන නම්වලින් හඳුන්වනු ලබන්නේ,
(1) දෙමාපියන් ය. (2) ගුරුවරුන් ය.
(3) මහා බ්‍රහ්මයා ය. (4) ශක්‍ර දේවේන්ද්‍රයා ය.

(14) ගංවතුර සුළි සුළං නායයෑම් ආදී ස්වභාවික විපත්වලට ජාති, ආගම්, කුල බේද නැත. එහිදී සියලු මිනිසුන් විපත්වලට පත්වෙයි. මෙබඳු ආපදාපන්න අවස්ථාවල දීබෞද්ධ අප ක්‍රියාකළ යුතු වන්නේ,
(1) ආත්මාර්ථකාමීත්වයෙනි. (2) පරාර්ථකාමීත්වයෙනි.
(3) සහජීවනයෙනි. (4) නිශ්ශරනාධ්‍යාශයෙනි.

(15) විපාක දෙන කාලය අනුව කර්මය සතර ආකාරයට බෙදෙයි. එයින් එක් කරුණක් වන්නේ,
(1) ගරුක කර්මයයි. (2) ආසන්න කර්මයයි.
(3) කටත්තා කර්මයයි. (4) අහෝසි කර්මයයි.

(16) ඔබ වහන්සේ පැවිදි වූයේ කවරකු උදෙසා ද? ඔබවහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? කාගේ දහමක් රුචි කරන්නේ ද? මෙම ප්‍රකාශය සිදුකරන ලද්දේ,
(1) සුභ මානවකයා විසින් ය. (2) සිඟාල ගෘහපතියා විසින් ය.
(3) උපතිස්ස පිරිවැජියා විසින් ය. (4) කෝලිත පිරිවැජියා විසින් ය.

(17) සහේතුක බව හේතු සහිත බව, අහේතුක නොවන බව යන කරුණු ඇතුළත් වන්නේ,
(1) චතුරාර්ය සත්‍ය ධර්මයෙහි ය. (2) පටිච්චසමුප්පාද ධර්මයෙහි ය.
(3) ත්‍රිලක්ෂණ ධර්මයෙහි ය. (4) ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි ය.

(18) ත්‍රිවිධ කණ්හාවෙහි දක්වෙන 'විභව තණ්හා' යනු,
(1) කම් සැප විඳීමට ඇති ආශාවයි.
(2) නැවත භවයක් ලැබීමට ඇති ආශාවයි.
(3) කම්සැප නොවිඳීමට ඇති ආශාවයි.
(4) නැවත භවයක් තැනැයි සිතමින් කම්සැප විඳීමට ඇති ආශාවයි.

(19) ''හැම කල්හිම මනා සිහියෙන් යුතුව පමණ දන ආහාර ගන්නා මිනිසුන්ගේ දුක් වේදනා තුනී වෙයි. ඔවුන්ගේ ආයුෂ වැඩෙන්නේ ය.' මෙම අදහස අන්තර්ගත සූත්‍ර දේශනාව වන්නේ,
(1) අණණ සූත්‍රයයි. (2) සෝණ සූත්‍රයයි.
(3) ද්‍රෝණපාක සූත්‍රයයි. (4) චිත්තකම්ම සූත්‍රයයි.

(20) ථෙරවාදී බෞද්ධ ධර්ම සංගායනා අතරින් පස්වන ධර්ම සංගායනාව පවත්වා ඇත්තේ,
(1) සියම් දේශයේ දී ය. (2) මියන්මාර් දේශයේ දී ය.

(3) කාම්බෝජ දේශයේ දී ය. (4) ලාඕම්ස් දේශයේ දී ය.

(21) කණිෂ්ක සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ත්‍රිපිටකයට විභාෂා නම් සර්වාස්තිවාදී අටුවා ග්‍රන්ථ සම්පාදනය කරන ලදී. එහිදී සූත්‍ර පිටකයට සම්පාදිත ග්‍රන්ථය වන්නේ,

(1) උපදේශ ශාස්ත්‍ර ග්‍රන්ථයයි. (2) අභිධර්ම විභාෂා ග්‍රන්ථයයි.

(3) කථාවත්ථුප්‍රකරණ ග්‍රන්ථයයි. (4) පාචිත්තිය පාලි ග්‍රන්ථයයි.

(22) මිහිඳු මහරහතන් වහන්සේගේ උපදෙස් මත බුදුරජාණන් වහන්සේගේ දකුණු අකුධාතුන් වහන්සේ තැන්පත් කර දෙවනපෑතිස් රජතුමා ඉදිකළ දාගැබ වන්නේ,

(1) මහියංගන දාගැබයි. (2) ලංකාරාම දාගැබයි.

(3) සේරුවිල දාගැබයි. (4) ථූපාරාම දාගැබයි.

(23) මෙතෙක් හමු වී ඇති කලාත්මක බවින් උසස් ම බෝධි පිහිටා ඇත්තේ,

(1) කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිලක්කගම ය.

(2) අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලේ ය.

(3) පොළොන්නරු දිස්ත්‍රික්කයේ මැදිරිගිරියේ ය.

(4) මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ලේ ය.

(24) වඩාත් සාර්ථක හා ඵලදායී රාජ්‍ය පාලනයක් උදෙසා දේසීය දස සත්වතාවත්වලට අයත් නොවෙන්නේ,

(1) නීතිය ක්‍රියාත්මක කරමින් නීතිවිරෝධී අධාර්මික ක්‍රියාවලින් වැළකීමයි.

(2) වැඩිහිටියන්ට සැලකීම සහ ඔවුන්ගේ අදහස්වලට ගරුකිරීම

(3) මිනිස් තිරිසන් ආදී සෑම කොටසකට ම ආරක්‍ෂාව ලබාදීමයි.

(4) සිල්වත්, ගුණවත් වියත් විශාරද පුද්ගලයන්ගේ අවවාද අනුශාසනා ලබා ගැනීම

(25) සියලු ම කෙළෙස් නැතිකොට උපදවන්නා වූ ලොකෝත්තර ඥාණය වන්නේ,

(1) පුබ්බේ නිවානුස්සති ඥාණයයි. (2) දිබ්බචක්ඛු ඥාණයයි.

(3) පරචිත්ත විජානන ඥාණයයි. (4) ආසවක්ඛ්‍ය ඥාණයයි.

(26) තෙරුවන් කෙරෙහි කරුණු දැකීමෙන් ඇතිවන අවෙචාචප්පසාදය කෙරෙහි බලපානුයේ,

(1) අමූලිකා ශ්‍රද්ධාවයි. (2) අනකාරවතී ශ්‍රද්ධාවයි.

(3) ඉන්ද්‍රීය සංවරයයි. (4) දුරදක්නා නුවණයි.

(27) රාගය නම් අරමුණුවල ඇලෙන ස්වභාවයත්, දෝසය නම් අරමුණුවල ගැටෙන ස්වභාවයත්, මෝහය නම් මුලාවන ස්වභාවයත්, පාලනය කරගැනීමට බෙහෙවින් උපකාරවන්නකි.

(1) වීර්යය (2) දානය

(3) පරිත්‍යාගය (4) ශ්‍රද්ධාව

(28) සතර අගතිය නිවැරදිව සඳහන් වන වරණය වන්නේ,

(1) ඡන්දය, ද්වේශය, ලෝභය, මෝහයයි.

(2) ඡන්දය, ද්වේශය, භය, මෝහයයි.
(3) ඡන්දය, ද්වේශය, රාගය, ව්‍යාධියයි.
(4) ඡන්ද, චිත්ත, වීරිය, විමංශයි.

(29) දානය ප්‍රියවචනය අර්ථචරියාව සමානාත්මතාවය' මෙම කරුණු සියල්ල හැඳින්වෙන ධර්මානුකූල වචනය වන්නේ,
(1) සතර ඍද්ධිපාද ය. (2) සතර සංවරශීලය යි.
(3) සතර සංග්‍රහවස්තු ය. (4) සතර අහර්ය ධර්මය

(30) අනුරාධපුර යුගයේ රචනා වූ සාහිත්‍ය කෘති අතර භික්ෂූන් වහන්සේලාගේ විනය ශික්ෂාපද පිළිබඳව රචිත වර්තමානයේ පවා දක්නට ලැබෙන කෘතිය වන්නේ,
(1) සියබස්ලකර ග්‍රන්ථයයි.
(2) පරමත්ථ ජෝතිකා ග්‍රන්ථයයි.
(3) සිඛවළඳ හා සිඛවළඳ විනය ග්‍රන්ථයයි.
(4) ධම්පියා අටුවා ගැටපදයි.

(31) පොළොන්නරු යුගයේ විශාලත ම චිත්‍රවලිය අතර බුදුන්වහන්සේ දෙව්ලොව සිට සංකස්සපුරයට වැඩ ම කිරීම ඇතුළුව ජාතක කථා රැසක් සිතුවමට නගා ඇති ස්ථානය වන්නේ,
(1) දෙගල්දොරුව රජමහා විහාරයේ සිතුවම් ය.
(2) දිඹුලාගල ලෙන් විහාරයේ ඇති සිතුවම් ය.
(3) ගල්විහාර පිළිම ගෙයි ඇති සිතුවම් ය.
(4) තිවංක පිළිමගෙයි ඇති සිතුවම් ය.

(32) ත්‍රිපිටක ධර්මය වාචෝද්ගතව පවත්වාගෙන යාමෙන් එහි කිසියම් විකෘතිතාවයක් ඇතිවීමට තිබූ ඉඩකඩ මඟහැරී ගියේ ය. එම ප්‍රතිඵලය සඳහන් වන ධර්ම සංගායනාව වන්නේ,
(1) පංචසහිත ධර්ම සංගායනාවයි.
(2) සත්ත සහිත ධර්ම සංගායනාවයි.
(3) සාහස්සික ධර්ම සංගායනාවයි.
(4) ත්‍රිපිටක ග්‍රන්ථාරූඪ කිරීමේ ධර්ම සංගායනාවයි.

(33) ප්‍රමාණය දැන ආහාර ගන්නා ලෙස බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළේ,
(1) අජාසත් මහරජතුමාට ය. (2) බිම්බිසාර මහරජතුමාට ය.
(3) කොසොල් මහරජතුමාට ය. (4) උදේනි මහරජතුමාට ය.

(34) බුදු දහමේ මූලික ඉගැන්වීමක් වන චතුරාර්ය සත්‍ය දේශනාව පිළිබඳව සඳහන් වන ප්‍රධාන සූත්‍ර ධර්මය වන්නේ,
(1) චුල්ලකම්ම විභංග සූත්‍රයයි. (2) ධම්මචක්කපවත්තන සූත්‍රයයි.
(3) චුල්ලහත්ථි විදෝපම සූත්‍රයයි. (4) ආදිත්ත පරියාය සූත්‍රයයි.

(35) 'ඉමස්ස උප්පාද ඉදං උප්පජ්ජති....' යන පටිච්ච සමුප්පාද ධර්මයෙහි මූල සූත්‍රයේ පාලි පාඨයේ අදහස නිවැරදිව සඳහන් වන්නේ,

(1) මෙය ඇති කල්හි මෙය වෙයි යන්න ය.
(2) මෙය ඉපදීමෙන් මෙය උපදී යන්න ය.
(3) මෙය නැති කල්හි මෙය නොවේ යන්න ය.
(4) මෙය නැතිවීමෙන් මෙය නැතිවේ යන්න ය.

(36) ''අනිත්‍ය දුක්ඛ අනාත්ම'' බුදු දහමේ ඉගැන්වෙන මූලික ඉගැන්වීමකි. එය හඳුන්වන ධර්මානුකූල වචනය වන්නේ,
(1) ත්‍රිශික්ෂාවන් ලෙස ය. (2) ත්‍රිවිද්‍යාවන් ලෙස ය.
(3) ත්‍රිවිධ ඥාණයන් ලෙස ය. (4) ත්‍රිලක්ෂණ ලෙස ය.

(37) විපාක දෙන කාලය අනුව කර්මය සතර ආකාරයකි. එයින් උපපජ්ජවේදනීය කර්මය යනු,
(1) මෙලොවදීම විපාක දෙන කර්මයි.
(2) මරණින් මතු පළමු ආත්මභාවයේ දී ම විපාක දෙන කර්මයි.
(3) කවර හෝ ආත්මභාවයක විපාක දෙන කර්මයි.
(4) විපාක නොදී අහෝසි වී යන කර්මයි.

(38) දුටුවිට හුනස්නෙන් නැගිටීම, අවශ්‍ය උපස්ථාන සිදුකිරීම, මැනවින් ඉගෙන ගැනීම ආදිය
(1) ශිෂ්‍යයාගෙන් ගුරුවරයාට ඉටුවිය යුතු යුතුකම් ය.
(2) ගිහියාගෙන් පැවිද්දාට ඉටුවිය යුතු යුතුකම් ය.
(3) භාර්යාවගෙන් ස්වාමියාට ඉටුවිය යුතු යුතුකම් ය.
(4) දූ දරුවන්ගෙන් මව්පියන්ට ඉටුවිය යුතු යුතුකම් ය.

(39) 'රාගාදී කෙලෙස්වලින් තොර වූ බුදුරජාණන් වහන්සේ බැබළුණේ මඩ සහිත ජලයේ නොතැවරී උඩට මතු වූ නෙළුම්මලක් සේ ය.' මෙම අදහසින් ප්‍රකට වන ශ්‍රේෂ්ඨ බුදු ගුණය වන්නේ,
(1) බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ශාස්තෘත්වයයි.
(2) බුදුන්වහන්සේගේ යථාවාදී තථාකාරී ගුණයයි.
(3) බුදුන් වහන්සේගේ තාදී ගුණයයි.
(4) බුදුන් වහන්සේගේ පද්මාකාර ජීවිතයයි.

(40) ආරෝග්‍ය පරමාලාභා යනාදී ගාථාව අනුව පරම සැපය වන්නේ,
(1) නීරෝගී භාවයයි. (2) සතුටයි.
(3) විශ්වාසවන්ත භාවයයි. (4) නිර්වාණයයි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

(i) පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. ලකුණු 20කි.

(ii) 02 සිට 07 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න හතරක් ද තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතුයි. එක් එක් ප්‍රශ්නයට ලකුණු 10ක් බැගින් හිමිවේ.

(01) (1) සතර බිය නම් කරන්න.

(2) ''යේ ධම්මා හේතුප්පභවා...' යන ගාථාව සම්පූර්ණ කරන්න.

(3) කාම තණ්හාව යන්නෙහි අර්ථය ලියන්න.

(4) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථාන දෙකක් ලියන්න.

(5) බුදුරජාණන් වහන්සේ විසින් වදාළ රෝග දෙයාකාරය මොනවා ද?

(6) භික්ෂූන් වහන්සේලා විසින් ආහාර ගැනීමේ දී නොකළ යුතු දේවල් දෙකක් ලියන්න.

(7) ගර්භයේ ස්වරූපය අනුව ස්තූප වර්ග හයකි. ඉන් හතරක් නම් කරන්න.

(8) ''පූජාවලිය'' කෘතිය රචනා කිරීමේ දී වස්තු විෂය කරගෙන ඇති බුදු ගුණය හා එහි කතුවරයා ලියන්න.

(9) සතර සංග්‍රහ වස්තු පිළිවෙළින් නම් කරන්න.

(10) ආකාරවතී ශ්‍රද්ධාව යනු කුමක් ද? (2 × 10 = 20)

(02) (1) ''ආරභථ නික්ඛමථ.....'' ගාථාව නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව සම්පූර්ණ කරන්න.

(2) ගෞතම බෝසත් දෙවියන් මනුලොව ඉපදීමේ අභියෝගය ජයගත් අයුරු කෙටියෙන් විස්තර කරන්න.

(3) ශිෂ්‍ය ජීවිතයේ මුහුණ දෙන ගැටලු තුනක් නම් කර, සිද්ධාර්ථ කුමාර චරිතයෙන් ආදර්ශ ගෙන ඒවා විසඳා ගත හැකි ආකාරය පෙන්වා දෙන්න. (2 + 3 + 5 = 10)

(03) (1) සිගාලෝවාද සූත්‍රානුගතව ගුරුවරුන් හා හිත මිතුරන් දක්වා ඇති දිශාවන් නම් කරන්න.

(2) මව්පියන් නැගෙනහිර දිශාවට උපමා කර ඇත්තේ කුමක් නිසා ද?

(3) බුදු දහමේ ඉගැන්වෙන යුතුකම් අන්‍යෝන්‍ය වශයෙන් ඉටුකරන සමාජයක සේව්‍ය-සේවක සබඳතා ශක්තිමත් වන ආකාරය පෙන්වා දෙන්න. (2 + 3 + 5 = 10)

(04) (1) ''චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි චේතයිත්වා කම්මං කරෝති, කායෙන වාචාය මනසා'' යන්නෙහි අර්ථය ලියන්න.

(2) අකුසල මූල තුන නිවැරදිව ලියන්න.

(3) කර්ම සිදු කිරීම තුළින් ඔබගේ මෙලොව හා පරලොව ජීවිතය සුඛිත මුදිත වන ආකාරය පැහැදිලි කරන්න. (2 + 3 + 5 = 10)

(05) (1) අප අවට පරිසරයේ දක්නට ලැබෙන ප්‍රධාන අංශ දෙක ලියන්න.

(2) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය දම් සභා මණ්ඩප බවට පත්කර ගත් අවස්ථා 3ක් ලියන්න.

(3) බුදුරජාණන් වහන්සේ පරිසරයේ සොඳුරු බව අගය කළ අවස්ථා රැසකි. නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (2 + 3 + 5 = 10)

(06) (1) භික්ෂූන් වහන්සේ සම්බන්ධව දේශනා කර ඇති සිව්පසය ලියා දක්වන්න.

(2) ගිජු ලෙස ආහාර ගන්නා පුද්ගලයින් තිදෙනෙක් අර්ථ සහිතව දක්වන්න.

(3) ආහාර අනුභව කිරීමේ දී පුද්ගලයා විසින් අනුගමනය කළ යුතු සිරිත් විරිත් පෙන්වා දෙන්න.

(2 + 3 + 5 = 10)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(1) අලුවිහාර ධර්ම සංගායනාව

(2) ශාරීරික චෛත්‍යය

(3) ඔබ කැමති සාහිත්‍ය කෘතිය

(4) සප්ත අපරිහානීය ධර්ම (5 + 5 = 10)